සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

## දෙවන වාර පරීක්ෂණය - 2024
**இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024**

| ශ්‍රේණිය / தரம் / Grade | 10 ශ්‍රේණිය |
|---|---|

# ගණිතය - I

| කාලය / நேரம் / Time | පැය 02 |
|---|---|

නම / பெயர் / Name ........................................................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ......................................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- **A** කොටසෙහි සියලුම ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 02 බැගින් ද, **B** කොටසෙහි එක් ප්‍රශ්නයක නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 10 බැගින් ද හිමිවේ.

## A කොටස

1. $\sqrt{30}$ ට වඩාත්ම ආසන්න අගය තෝරා ඒ යටින් ඉරක් අදින්න.
(i) 5.3 (ii) 5.4 (iii) 5.5 (iv) 5.6

2. පැයට කිලෝමීටර 100ක ඒකාකාර වේගයෙන් ගමන් කරන වාහනයක් පැය $2\frac{1}{2}$ක දී ගමන් කරන දුර සොයන්න.

3. $log_5 125 = 3$ මෙය දර්ශක ආකාරයෙන් ලියන්න.

4. දී ඇති කේන්ද්‍රික ඛණ්ඩයේ අරය 14$cm$ක් වේ. එහි චාප දිග සොයන්න.




5. රූපයේ දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




6. 12% සුළු පොලියට රු 10 000ක් ණයට ගත් පුද්ගලයෙකු රු 3600ක පොලියක් ගෙවිය යුත්තේ කොපමණ කාලයක් සඳහා ද?

7. $4xy,\ 2x^2y$ යන වීජීය පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

8. මිනිසුන් 10 දෙනෙකුට දින 8 ක දී කළ හැකි වැඩකින් අඩක් දින 5 කදී නිම කිරීමට අවශ්‍ය මිනිසුන් ගණන සොයන්න.

9. රූපයේ දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




10. දී ඇති වෙන් රූපයේ අඳුරු කර ඇති කොටස කුලක අංකනයෙන් ලියන්න.




11. සාධක සොයන්න. $x^2 + 11x + 24$

12. මල්ලක් තුළ එක සමාන රතු පාට බෝල තුනක් ද නිල් පාට බෝල හතරක් ද තිබේ. මල්ලෙන් අහඹු ලෙස බෝලයක් ඉවතට ගත් විට එය නිල් පාට ලැබීමේ සම්භාවිතාවය සොයන්න.

13. රූපයේ දැක්වෙන PQRS සමාන්තරාස්‍රයේ $S\hat{P}Q + S\hat{R}Q = 220^0$ ක් නම්, $P\hat{Q}R$ හි අගය සොයන්න.




14. විසඳන්න. $(x-1)(x+3) = 0$

15. රූපයේ දී ඇති තොරතුරු අනුව පහත දැක්වෙන වගුවේ නිවැරදි ප්‍රකාශ ඇත්නම් ඒ ඉදිරියේ ✓ ලකුණ ද වැරදි ප්‍රකාශ ඇත්නම් ඒ ඉදිරියේ ✗ ලකුණ ද යොදන්න.

| | |
|---|---|
| $QO = OR$ ද $PO = OS$ ද වේ. | |
| $PQS$ හි වර්ගඵලය $= \frac{1}{2} \times PQRS$ වර්ගඵලය | |




16. ධාරිතාවය ලීටර 480ක් වන ටැංකියකට මිනිත්තුවකට ලීටර 80ක සීඝ්‍රතාවයකින් නලයකින් ජලය පිරේ. ටැංකිය සම්පූර්ණ පිරවීමට ගතවන කාලය මිනිත්තු කොපමණ ද?

17. රූපයේ දැක්වෙන අරය $7cm$ක් වූ කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය $38.5cm^2$ක් වේ. මෙවැනි වෙනත් කේන්ද්‍රික ඛණ්ඩයක අරය $14cm$ක් නම් එහි වර්ගඵලය සොයන්න.



18. පාසලක සෞන්දර්ය අංශයේ සිසුන් අතරින් නැටුම් විෂය හදාරණ පිරිස මෙන් දෙගුණයක් සංගීතය ද, නැටුම් විෂය හදාරණ පිරිස මෙන් තුන් ගුණයක් චිත්‍ර විෂය ද හදාරයි නම් එම තොරතුරු නිරූපිත මෙවැනි වට ප්‍රස්තාරයක නැටුම් විෂය දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය සොයන්න.




19. $3x + 2y = 8$ යන සමගාමී සමීකරණ යුගලය නොවිසඳා $x + y$ හි අගය සොයන්න.
$x + 2y = 4$

20. රූපයේ දැක්වෙන ත්‍රිකෝණ අතරින් අංගසම වන ත්‍රිකෝණ යුගලය නම් කර, එය අංගසම වන අවස්ථාව ද ලියන්න.




21. දී ඇති සරල රේඛා ඛණ්ඩයේ අනුක්‍රමණය සොයන්න.




22. රූපයේ ABC සරල රේඛාවකි. මෙම තොරතුරු අනුව සමාන පාද දෙකක් නම් කරන්න.




23. රූපයේ දැක්වෙන්නේ A ට $7cm$ක් දුරින් අඳින ලද පථයකි. පථ පිළිබඳ දැනුම භාවිතයෙන් එම පථය මත A ට හා C ට සමදුරින් වූ P ලක්ෂ්‍යයක් පිහිටුවන්න.




24. රූපයේ දැක්වෙන තොරතුරු අනුව $x + y$ හි අගය සොයන්න.




25. විසඳන්න. $\frac{3}{2x} - \frac{1}{3x} = \frac{1}{6}$

## B කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. සමන් රැගෙන එන ලද බීම බෝතලයෙන් $\frac{2}{5}$ ක් තම මිතුරාට බීමට දෙන ලදී. ඉතිරි කොටසින් $\frac{2}{3}$ ක් තම සහෝදරයාට දී ඉතිරි බීම ප්‍රමාණය සමන් බීමට ගන්නා ලදී.

   (i) සමන් මිතුරාට බීමට දුන් පසු ඉතිරි බීම ප්‍රමාණය භාගයක් ලෙස දක්වන්න. (ලකුණු 2)

   (ii) සහෝදරයට දෙන ලද බීම ප්‍රමාණය මුළු බීම ප්‍රමාණයෙන් භාගයක් ලෙස දක්වන්න. (ලකුණු 2)

   (iii) සමන් බීමට ගන්නා ලද බීම ප්‍රමාණය මුළු ප්‍රමාණයෙන් භාගයක් ලෙස ලියන්න. (ලකුණු 3)

   (iv) සමන් බීමට ගන්නා ලද බීම ප්‍රමාණය $200ml$ ක් නම්, ඔහු රැගෙන ආ මුළු බීම ප්‍රමාණය ලීටර වලින් සොයන්න. (ලකුණු 3)

2. එළවළු වගා කර ඇති බිමක එළවළු වර්ග කිහිපයක් බිම් ප්‍රමාණ අනුව වගා කර ඇති ආකාරය වට ප්‍රස්තාරයෙන් දැක්වේ.




   (i) අඩුවෙන් ම වගා කර ඇති එළවළු වර්ගය කුමක් ද? (ලකුණු 2)

   (ii) බෝංචි හා අල වගා කර ඇති බිම් ප්‍රමාණ අතර අනුපාතය ලියන්න. (ලකුණු 2)

   (iii) ලීක්ස් වගා කර ඇති බිම් ප්‍රමාණය මුළු බිම් ප්‍රමාණයෙන් භාගයක් ලෙස දක්වන්න. (ලකුණු 2)

   (iv) ගෝවා වගා කර ඇති බිම් ප්‍රමාණය $200m^2$ ක් නම්, ඉඩමේ මුළු බිම් ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 2)

   (v) ඊළඟ වගා වාරයේ දී ලීක්ස් වගා කරන සියලුම දෙනා ද අල වගා කළේ නම්, දැන් අල වගා කර ඇති බිම් ප්‍රමාණය කොමණ ද? (ලකුණු 2)

Past Papers Wiki

3. (a) වාර්ෂික වටිනාකම රු 56 000ක් වන නිවසක් සඳහා වාර්ෂිකව 8%ක් වරිපනම් ගෙවිය යුතු ය.

(i) වාර්ෂිකව ගෙවිය යුතු වරිපනම් මුදල කොපමණ ද? (ලකුණු 2)

(ii) කාර්තුවකට ගෙවිය යුතු වරිපනම් මුදල සොයන්න. (ලකුණු 2)

(iii) මුල් කාර්තුව තුල වාර්ෂික වරිපනම් මුදල ගෙවීමේදී 2%ක වට්ටමක් දෙනු ලැබේ. ඉහත වරිපනම් මුදල සඳහා ලැබෙන වට්ටම සොයන්න. (ලකුණු 2)

(b) මිනිසුන් 5 දෙනෙක් යොදාගෙන දිනකට පැය 6 බැගින් කාණුවක් සෑදීමට දින 16ක් ගතවන බව ඇස්තමේන්තු කර ඇත.

(i) එම කාර්ය නිම කිරීමට අවශ්‍ය මිනිස් පැය ගණන කොපමණ ද? (ලකුණු 2)

(ii) දිනකකට පැය 8 බැගින් වැඩ කලහොත් ඉහත කාර්යය දින කීයකට කලින් නිම කළ හැකි වේ ද? (ලකුණු 2)

4. ක්‍රිකට් කණ්ඩායමක සිටින ක්‍රීඩකයින් 11 දෙනාගෙන් පිතිකරුවන් 5 දෙනෙක් ද, වේග පන්දු යවන්නන් තිදෙනෙක් ද, දඟ පන්දු යවන්නන් දෙදෙනෙක් හා කඩුලු රකින්නෙකු ද සිටිති. ක්‍රීඩකයින් 11 දෙනා ම 1 සිට 11 තෙක් අංක යොදා ඇති ඇඳුම් පැළඳගෙන සිටිය හ. මෙම කණ්ඩායමෙන් අහඹු ලෙස ක්‍රීඩකයෙකු ගත්විට

(i) ඔහු පිතිකරුවෙකු වීමේ සම්භාවිතාවය සොයන්න. (ලකුණු 2)

(ii) ඔහු වේග පන්දු යවන්නෙකු වීමේ සම්භාවිතාවය සොයන්න. (ලකුණු 2)

(ii) ඔහු දඟ පන්දු යවන්නෙකු වීමේ සම්භාවිතාවය සොයන්න. (ලකුණු 2)

(iv) වැඩිම ලකුණු රැස් කළ ක්‍රීඩකයා පන්දු යවන්නෙක් වීමේ සම්භාවිතාවය සොයන්න. (ලකුණු 2)

(v) ඔහු ප්‍රථමක සංඛ්‍යා අංකයක් සහිත ඇඳුමක් පැළඳ සිටි අයෙකු වීමේ සම්භාවිතාවය සොයන්න. (ලකුණු 2)

5. ABCD සෘජුකෝණාස්‍රාකාර තහඩුවකින් අරය 28*cm*ක් වන කේන්ද්‍රික ඛණ්ඩයක් කපා ඉවත් කර ඇත.




(i) කේන්ද්‍රික ඛණ්ඩයේ AE චාප දිග සායන්න, (ලකුණු 2)

(ii) අඳුරු කර ඇති කොටසේ පරිමිතිය සොයන්න. (ලකුණු 2)

(iii) කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය සොයන්න. (ලකුණු 2)

(iv) අඳුරු කළ කොටසේ වර්ගඵලය සොයන්න. (ලකුණු 2)

(v) මෙහි දක්වා ඇති කේන්ද්‍රික ඛණ්ඩය වෙනුවට කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලයට සමාන AD පාදයක් වනසේ සෘජුකෝණාස්‍රාකාර කොටසක් කපා ඉවත් කළේ නම්, එම කපන ලද සෘජුකෝණාස්‍රාකාර කොටසේ පළල සොයන්න. (ලකුණු 2)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 10 ශ්‍රේණිය | **ගණිතය - II** | කාලය / நேரம் / Time } පැය 03 |

ප්‍රශ්න පත්‍රය කියවීම සඳහා අමතර මිනිත්තු 10 ක කාලයක් ලැබේ.

- සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.
- **11 පත්‍රයේ A කොටසින් ප්‍රශ්න පහකටත් B කොටසින් ප්‍රශ්න පහකටත් පිළිතුරු සපයන්න.**

## A කොටස

1. (a) ජංගම දුරකතන ආනයනය කරන ව්‍යාපාරිකයෙක් ජංගම දුරකතනයක් වෙනුවෙන් 30% ක තීරු ගාස්තුවක් ගෙවා 25%ක ලාභයක් තබාගෙන අලෙවි කිරීමට තීරණය කරයි. ජංගම දුරකතනයේ ආනයනික මිල රු 25 000 ක් නම්, එහි විකුණුම් මිල සොයන්න. (ලකුණු 7)

(b) 12% ක සුළු පොලියක් ගෙවන මූල්‍ය ආයතනයක රු40 000ක් තැන්පත් කළ අයෙකුට වසර දෙකක් අවසානයේ ලැබෙන මුළු මුදල කොපමණ ද? (ලකුණු 3)

2. $y = x^2 - 4$ හි වර්ගජ ශ්‍රිතයක ප්‍රස්තාරයක් ඇඳීමට අදාළ අසම්පූර්ණ වගුවක් පහත දැක්වේ.

| $x$ | -3 | -2 | -1 | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|
| $y$ | **5** | **0** | **-3** | …. | **-3** | **0** | **5** |

(i) $x = 0$ වන විට $y$ හි අගය ලියන්න. (ලකුණු 1)

(ii) x හා y අක්ෂය දිගේ කුඩා බෙදුම් 10 කින් ඒකක එකක් ලෙස පරිමාණය ගෙන ඉහත ප්‍රස්තාරය අඳින්න. (ලකුණු 3)

ප්‍රස්තාරය ඇසුරෙන්,

(iii) අවම ලක්ෂ්‍යයේ ඛණ්ඩාංකය ලියන්නී (ලකුණු 2)

(iv) $y = 0$ වන විට ලැබෙන $x$ හි අගයන් මොනවා ද? (ලකුණු 2)

(v) ශ්‍රිතය සෘණව වැඩි වන $x$ හි අගය පරාසය ලියන්න. (ලකුණු 2)

3. (a) සෘජුකෝණාස්‍රාකාර ඉඩමක පරිමිතිය මීටර 80 ක් වේ. එහි දිග පළලට වඩා මීටර් 10ක් වැඩි ය.

(i) එහි දිග මීටර $a$ ද පළල මීටර $b$ ලෙස ගෙන සමගාමී සමීකරණ යුගලයක් ගොඩනගන්න. (ලකුණු 2)

(ii) ඒවා විසඳීමෙන් ඉඩමේ දිග හා පළල සොයන්න. (ලකුණු 5)

(b) භූමියක ධාන්‍ය අස්වනු නෙළීමට විශාල යන්ත්‍රයකට දින 10ක් ද, කුඩා යන්ත්‍රයකට දින 15ක් ද ගතවේ. යන්ත්‍ර දෙකම එකවර මෙම භූමියේ අස්වනු නෙළීමට යෙදුවුවහොත් ඒ සඳහා ගතවන දින ගණන සොයන්න. (ලකුණු 3)

4. එක්තරා පාසලක සතියේ දිනක ශිෂ්‍ය සංඛ්‍යාවේ පැමිණීම පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| ශිෂ්‍ය සංඛ්‍යාව $(x)$ | 38 | 39 | 40 | 41 | 42 | 43 | 44 |
|---|---|---|---|---|---|---|---|
| පන්ති ගණන $(f)$ | 2 | 5 | 6 | 9 | 5 | 2 | 1 |

a) එදින පන්තියක සිසුන්ගේ පැමිණීමේ

(i) මාතය කුමක් ද ? (ලකුණු 2)

(ii) මධ්‍යස්ථය කුමක් ද ? (ලකුණු 2)

(iii) මධ්‍යන්‍යය සොයන්න. (ලකුණු 4)

(b) එක් සිසුවෙකුට දිවා ආහාර වේලක් සඳහා රු 100ක මුදලක් වෙන්කර ඇත්නම් එම සතිය තුළ පාසලේ සිසුන් ගේ දිවා ආහාරය සඳහා වැයවන මුදල කොපමණ වේ දැයි සොයන්න.

(ලකුණු 2)

5. (i) ABC ත්‍රිකෝණයේ $A\hat{B}C = 90^0$ ද, $AB = n$, $BC = n + 3$ ද හා $AC = 15$ ක් ද වේ. මෙම තොරතුරු අනුව $n$ ඇසුරෙන් දැක්වෙන වර්ගජ සමීකරණයක් ගොඩ නගන්න. (ලකුණු 5)

(ii) ඉහත සමීකරණය විසඳීමෙන් $n$ හි අගය සොයා, ABC ත්‍රිකෝණයේ පාදවල දිග සොයන්න. (ලකුණු 5)

6. සමතල බිමක පිහිටි පාසල් ගෙවත්තක A, B, C ලක්ෂ්‍ය තුනක පිහිටුම් ලබාගෙන ඇති අයුරු පහත දැක්වේ.

- ✵ A ට $60m$ ක් උතුරෙන් B පිහිටා ඇත
- ✵ A ට $300^0$ ක දිගංශයකින් $80m$ දුරින් C පිහිටා ඇත.



(j) ඉහත තොරතුරු හා මිනුම් ලබා ගැනීමට භාවිත කළ එක් උපකරණයක් මෙම රූපයේ දැක්වේ. මෙම උපකරණය නම් කර, එමගින් ලබා ගන්නා මිනුම නම් කරන්න. (ලකුණු 2)

(ii) ඉහත තොරතුරු දළ රූප සටහනක දක්වන්න. (ලකුණු 01)

(iii) $1cm$ කින් $10m$ දැක්වෙන පරිමාණයට ඉහත තොරතුරු පරිමාණ රූපයක දක්වන්නේ නම එම පරිමාණය අනුපාතයක් ලෙස දක්වන්න. (ලකුණු 02)

(iv) ඉහත පරිමාණයට එම තොරතුරු පරිමාණ රූපයක දක්වන්න. (ලකුණු 2)

(v) පරිමාණ රූපය ඇසුරෙන් **BC** සැබෑ දුර සොයන්න. (ලකුණු 3)

PAST PAPERS WIKI



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

## B කොටස

7. පළමු රටාව 1, 3, 5, 7, …

දෙවන රටාව 2, 4, 6, 8, …

(i) පළමු රටාවේ පොදු පදය ($n$ වන පදය ) සොයන්න. (ලකුණු 2)

(ii) දෙවන රටාවේ පොදු පදය ($n$ වන පදය) සොයන්න. (ලකුණු 2)

(iii) ඉහත (i) හා (ii) න් දැක්වෙන පොදු පදවල ඓක්‍යය දැක්වෙන ප්‍රකාශනයක් ලියන්න. (ලකුණු 2)

(iv) ඉහත (iii)හි පොදු පදවල ඓක්‍යය ලෙස ලැබෙන ප්‍රකාශනය පොදු පදය වශයෙන් පිහිටන සංඛ්‍යා රටාවේ මුල් පද හතර ලියා දක්වන්න. (ලකුණු 4)

8. සරල දාරය කවකටුව හා පැන්සල භාවිත කරමින් නිර්මාණ රේඛා පැහැදිලිව දක්වමින් පහත නිර්මාණය කරන්න.

(i) $AB = 5cm$, $BC = 5.5cm$ ක් හා $A\hat{B}C = 120^0$ ක් වන පරිදි ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න. (ලකුණු 4)

(ii) AC පාදයේ දිග මැන ලියන්න. (ලකුණු 2)

(ii) A සිට දික් කළ CB පාදයට ලම්භයක් නිර්මාණය කර එහි අඩිය D ලෙස නම් කරන්න. (ලකුණු 2)

(iv) ABC ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න. (ලකුණු 2)

9. ABC ත්‍රිකෝණයේ BC පාදයේ මධ්‍ය ලක්ෂ්‍යය O වේ. $OP = OQ$ වනසේ P හා Q ලක්ෂ්‍ය පිළිවෙලින් AB හා AC මත පිහිටයි. PO පාදය R දක්වා දික්කර ඇත්තේ $PO = OR$ වන පරිදි ද QO පාදය S දක්වා දික්කර ඇත්තේ $QO = OS$ වන පරිදි ය. PQRS සමාන්තරාස්‍රයක් වන බවත්, BS // AC බවත් සාධනය කරන්න. (ලකුණු 10)

10. දී ඇති රූපයේ $B\hat{A}C = 40^0$ ද $AB = AC$ ද ABPQ හා ACR සමචතුරස්‍ර ද වේ.




(i) $Q\hat{A}S$ හි අගය සොයන්න. (ලකුණු 2)

(ii) PAR සමද්විපාද ත්‍රිකෝණයක් බව පෙන්වන්න. (ලකුණු 2)

(ii) $PC = BR$ බව සාධනය කරන්න. (ලකුණු 6)

11. (i) අගය සොයන්න. $log_{10}125 + log_{10}24 - log_{10}3$ (ලකුණු 2)

(ii) විසඳන්න.

$log_5 2 + log_5 x = log_5 6 + log_5 3$ (ලකුණු 2)

(iii) ලඝුගණක වගු භාවිතා කොට $\frac{15.31 \times 4.9}{7.91}$ හි අගය පළමු දශමස්ථානයට නිවැරදිව සොයන්න. (ලකුණු 6)

12. පාසලක ක්‍රීඩා පුහුණුව සඳහා පැමිණෙන සිසුන් 40 දෙනෙක් පිළිබඳ තොරතුරු පහත වෙන් රූපයේ දැක්වේ.




මෙම සිසුන් අතරින් ගැහැණු ළමයින් 12 දෙනෙක් සිටි අතර, ඉන් 9 ක් මලල ක්‍රීඩා කරති. වෙනත් ක්‍රීඩා කරන පිරිමි ළමයින් සංඛ්‍යාව 10 කි.

(i) දී ඇති වෙන් රූපය ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කර, එක් එක් පෙදෙස්වලට අයත් අවයව සංඛ්‍යාව ලියා දක්වන්න. (ලකුණු 4)

(ii) මලල ක්‍රීඩා කරන පිරිමි ළමුන් ගණන කොපමණ ද? (ලකුණු 1)

(ii) වෙනත් ක්‍රීඩා කරන ගැහැණු ළමුන් දැක්වෙන පෙදෙස ඔබ අඳින ලද වෙන් රූපයේ අඳුරු කර දක්වන්න. (ලකුණු 1)

වෙනත් ක්‍රීඩාවල නිරත ගැහැණු ළමුන් සියලු දෙනා ම ඊළඟ වසරේ දී මලල ක්‍රීඩා කිරීමට පමණක් තීරණය කෙරුණි.

(iv) වෙනස් වූ දත්ත සලකා ඉහත වෙන් රූප සටහන නැවත ඔබේ පිළිතුරු පත්‍රයේ ඇඳ, එහි නව දත්ත ඇතුළත් කරන්න. (ලකුණු 4)



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

